**ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය - 2019**
**-----------------------------------------------------**

**1 මතය**
**------**

ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනයේ හා එහි පරිපාලිතයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාව ප්‍රකාරව මාගේ විධානය යටතේ විගනනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයේ හා එහි පරිපාලිතයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.1 මතය සඳහා පදනම**
**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරිම කළමණාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරිමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරිම කළමණාකරණයේ වගකීමක් වන අතර, කළමණාකාරීත්වය ආයතනය ඈවර කිරිමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරිමද කළමණාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරිමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්ම සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය  ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ.මාගේ විගණනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල  ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීතිරීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීතිරීති/ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) මුදල් රෙගුලාසි 452(1) | විගණන විමසුම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිලධාරී යටතේ පවත්වා ගෙන යාමට කටයුතු කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විගණන විමසුම් ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 891(1) | ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ණය ලබා ගැනීමේ දී ඒ සඳහා ඇප වන නිලධාරීන් පිළිබඳ ලේඛණයක් පවත්වා ගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබද ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන යාමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 89,504,087 ක බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. 30,259,836 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 59,244,251 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2018 ඔක්තෝම්බර් 16 දිනැති අංක DMS/1674/2017 දරන කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් සෑම වර්ෂයකම දිරි දීමනා සඳහා වැය වන පිරිවැය සඳහා ආයතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු බව දක්වා තිබුණද එවැනි අනුමැතියක් ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා දිරි දීමනා සඳහා රු.130,111,164 ක් ගෙවා තිබුණි. | අවශ්‍ය මූල්‍ය ප්‍රකාශන පාලක මණ්ඩලයට අනුමැතිය සඳහා යොමු කර ඇත. | දිරි දීමනා ගෙවීමට පෙර චක්‍රලේඛයේ විධිවිධාන අනුව පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ii) | බෙදාහැරිය හැකි දිරි දීමනා ගණනය කිරීමේදී ආදායමෙන් සියයට 11 ක් හා මෙහෙයුම් ලාභයෙන් සියයට 5 ක් ලෙස ගණනය කිරීම නිසා ආදායම සඳහා දෙවරක් දිරි දීමනා ගණනය කිරීමක් සිදු වන බව නිරීක්ෂණය විය. එසේම මෙහෙයුම් ලාභය මත දිරි දීමනා ගණනය කිරීමේ දී රු.407,375,251 ක් වූ වර්ෂයේ සෘජු වියදම් අඩු කිරීමට අවධානය යොමු කර නොතිබුණි. | මේ සඳහා අනුමැතිය කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව ලබා දී ඇත. | ආදායම හා මෙහෙයුම් ලාභය මත දිරි දීමනා ගණනය කිරීමේ දී අවස්ථා 2 කදී ආදායම සැලකිල්ලට ගැනීමක් සිදු වී ඇත. එසේම ආදායම් ඉපයීමට සෘජුව බලපාන වියදම් අඩු කිරීමටත් අවධානය යොමු විය යුතුය. |
| (iii) | 2019 වර්ෂයේ බෙදාහැරිය හැකි දිරි දීමනා සඳහා ආදායම ගණනය කිරීමේදී කාර්යය සාධන මිනුමක් නොවන සේවක ණය පොළී හා ආයෝජන පොළී 2018 හා 2019 වර්ෂ වල පිළිවෙලින් එකතුව රු.17,278,940 ක් හා රු.32,446,660 ක් වෙනත් ආදායම් ලෙස සැලකිල්ලට ගෙන තිබුණි. | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලබා දී ඇති අනුමැතියට අනුව ගණනය කිරීම් සිදු කෙරේ. | කාර්යය සාධන මිනුම් ලෙස සලකා බැලිය නොහැකි අයිතම ඉවත් කර දිරි දීමනා ගණනය කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |
| (iv) | 2007 මාර්තු 14 දිනැති අංක NSCC/PO/01/84 CBI දරන වැටුප් හා සේවක කොමිෂන් සභාවේ ලේකම් විසින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කළ ලිපිය අනුව ඉතිරි කර ගත් නිවාඩු සඳහා මුදල් ගෙවීමට හිමිකම් නොලබන බව දක්වා තිබුණද ආයතනය විසින් ඊට පටහැනි ලෙස ඉතිරි කර ගත් නිවාඩු සඳහා 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු.24,334,948 ක් ගෙවීම් කර තිබුණි. | වෛද්‍ය නිවාඩු දිරි දීමනා ගෙවීමේදී සැලකිල්ලට භාජනය කරනු නොලබන අතර ඒ සඳහා වෙනත් ක්‍රම වේදයකට අනුව 1991 වර්ෂයේ සිට මේ දක්වා අඛණ්ඩව ගෙවීම් සිදු කර ඇත. | පවත්නා චක්‍රලේඛ වලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | 2018 දෙසැම්බර් 07 දිනැති රාජ්‍ය ව්‍යාපාර අංක PED 3/2018 දරන චක්‍රලේඛයට පටහැනිව විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව ආයතනය විසින් 2018 හා 2019 වර්ෂ වලදී පිළිවෙලින් රු.2,313,892 ක් හා රු.2,314,126 ක් ගෙවීම් කර තිබුණි. | PED 3/2018 චක්‍රලේඛයට අනුව ප්‍රසාද දීමනාවක් ලෙස සැලකිය හැකි මධ්‍ය කාලීන දීමනාවක් ආයතනය විසින් සේවකයින්ට කිසි විටෙකත් ගෙවා නොමැත. මෙම චක්‍ර ලේඛයට අනුව ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවෙන් අඩුකර ගැනීමට අත්තිකාරම් මුදලක් නොමැති බැවින් හිමි සම්පූර්ණ ප්‍රසාද දීමනාව ගෙවා ඇත. | චක්‍රලේඛයට අනුකූලව ගතව කටයුතු කළ යුතුය. |

**3.2 කාර්යය මණ්ඩල පරිපාලනය**

------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමණාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යමණ්ඩලය හා අනධ්‍යයන කාර්යමණ්ඩලය තනතුරු යටතේ 55 බැගින් අනුමත වී තිබුණ ද තත්‍ය කාර්යමණ්ඩලය පිළිවෙලින් 50 ක් හා 45 ක් වූයෙන් පිළිවෙලින් 51 දෙනෙකුගේ හා 13 දෙනෙකුගේ සේවය කොන්ත්‍රාත් පදනම මත ලබා ගෙන තිබුණි. | ආයතනයේ පාඨමාලා ප්‍රමාණය වැඩි වීමත් සමඟ තනතුරු වැඩි කිරීමට සිදු වේ. ඒ නිසා කොන්ත්‍රාත් පදනමට බඳවා ගෙන ඇත. | පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීම් කල යුතුය. |

**4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**4.1 තිරසර සංවර්ධන අරමුණු**

---------------------------

| **විගණන නිරීක්ෂණ** | **කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය යටතේ ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයේ කාර්යභාරයන්ට අදාළ තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක මත ලගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් පිළියෙල කර නොතිබුණි. | මේ පිළිබඳ තොරතුරු ඉදිරියේදී විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |